කොවිඩ් ව්‍යාප්තිය



දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

සාර භූමියේ හරිතාභන්දය අද පත්‍රය සමග



ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ වප් අව එකොළොස්වක ලත් බුධ දින | කාණ්ඩය 111 | පත්‍රය 281 | පිටු 24 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 නොවැම්බර් 11 බදාදා

අක්කර 400ක ඖෂධ නිෂ්පාදන කලාපයක් හම්බන්තොට ඇරඹේ

මහින්ද අලුත්ගෙදර

හම්බන්තොට ආරබොක්ක වතුයායේ ඖෂධ නිෂ්පාදනය සඳහාම වෙන් වූ අක්කර 400ක ඖෂධ කලාපයක් ස්ථාපිත කිරීමට රජය තීරණය කර තිබේ.

මේ සඳහා ශ්‍රී ලංකා ආයෝජන ... අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම ... සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිඅ... ඉදිරිපත් ක... ඇමැති ... අනුමැතිය හිමිව ඇත.

පිට 06

බාහිර බලපෑම් නිසා ජ්‍යෙෂ්ඨ නිලධාරීහු විපක්ෂ නායක කාර්යාලය හැරයති

...න් බලපෑම් එල්ල ...න විපක්ෂ නායක ... කලකිරීමට පත්ව ...මින් සිටින බව ...

...යන් හා හිතවතුන් ... කරන බව සමඟි ...ාවරණය කරති. ... රාජ්‍ය නිලධාරීන් ... විපක්ෂයක් ලෙස සාර්ථකව මුහුණ දීම අඩපණ වීමක් බව ද එම නියෝජිතයෝ පවසති.

සති කීපයක් තිස්සේ පාර්ලිමේන්තු විපක්ෂ නායක කාර්යාලයට පැමිණ නොමැති විපක්ෂ නායකවරයාගේ ලේකම්වරයා ඉල්ලා අස්වීමට තීරණය කර ඇති අතර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හා ප්‍රධාන පරිපාලන නිලධාරී ධුරයන් ද මේ වන විට හිස්ව ඇති බව පැවසේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වෙනත් අමාත්‍යාංශයකට මාරුවීමක් ඉල්ලා ගොස් ඇත්තේ ද මෙම බාහිර බලපෑම් හේතුවෙන් බව කියවේ.

පිට 06



කොවිඩ් මරණ 41ට නඟී

කොවිඩ් - 19 වයිරසය ආසාදනය වීම හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව ඊයේ (10) වන විට 41 ක් දක්වා ඉහළ ගොස් ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුම් දෙයි.

පිට 06

කොවිඩ් ආසාදිතයන්ට වෙන් වූ ඇඳන් 2850ක් තවම හිස්

පිට 06

කොවිඩ් ආසාදිතයන් නිවෙස්වල මියගියේ කෙසේද සොයන්න ත්‍රිපුද්ගල කමිටුවක්

පිට 06

චමීර ඇල්ලදෙනිය



කොළඹ මැනිං වෙළෙඳපොළ වසා දැමීමට සිදු වීමත් සමග දැඩි දුෂ්කරතාවයකට මුහුණ පා සිටින එළවළු ගොවීන්ට තම නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහා පැලියගොඩ ප්‍රදේශයේ නව ස්ථානයක් වෙන් කර දීම සම්බන්ධයෙන් රජයේ අවධානය යොමු කර තිබේ.

පිට 06

එළවළු වෙළෙඳපොළ පැලියගොඩට

රාජගිරිය, නාවල ඇළ හරහා නව පාලමක්

මහින්ද අලුත්ගෙදර

අංගම්පිටිය මාර්ගය ඇතුල්කෝට්ටේ දී සහ පාසල් මාවත රාජගිරිය, නාවල දී සම්බන්ධ කරමින් රාජගිරිය, නාවල ඇළ හරහා නව පාලමක් ඉදි කිරීමට රජය සැලසුම් කරයි.

පිට 06

1.2% කින් බස් ගාස්තු වැඩි වෙයි

නිමල් රාජපක්ෂ

කොවිඩ් ක්‍රමවේදයන්ට අනුව ආසන ගණනට මගීන් ප්‍රවාහනය කිරීම සඳහා බස් ගාස්තුව ඊයේ මධ්‍යම රාත්‍රියේ සිට සියයට 1.2 කින් වැඩි කිරීමට රජය තීරණය කොට ඇත.

ඒ අනුව රුපියල් 12 ගාස්තුව රුපියල් 14 දක්වා වැඩි වන බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා පවසයි.

ඇමැතිවරයා මෙම අදහස් පළ කළේ ප්‍රවාහන අමාත්‍යාංශයේ ඊයේ පැවැති මාධ්‍ය හමුවකදීය.

පිට 06

තානාපති සේවයට නම් කළ 7කට අනුමැතිය

මහින්ද අලුත්ගෙදර

සෞදි අරාබියාව, නෙදර්ලන්තය, ස්විඩනය, ඊජිප්තුව, පෝලන්තය, තායිලන්තය හා කැනඩාව යන රටවල් වෙනුවෙන් පත් කර සිටින තානාපතිවරුන් සහ මහ කොමසාරිස්වරුන් සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය හිමිව තිබේ.

පිට 06

මුස්ලිම් කොවිඩ් මරණ භූමදානය ගැන තීරණය සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුවයි

සමන්මලී ප්‍රියශාන්ති

කොවිඩ් ආසාදිත වීමෙන් මිය යන මුස්ලිම් පුද්ගල මරණ භූමිදානය කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් තීරණයක් ගනු ලබන්නේ සෞඛ්‍ය බලධාරීන් හා තාක්ෂණික වශයෙන් තීන්දු ගන්නා කණ්ඩායම්වලින් ලැබෙන උපදෙස් අනුව බව ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා දිනමිණට ඊයේ (10) පැවැසීය.

පිට 06

'ජනපති චීන ජනපති පිළිසඳරක්' පුවත ගැන පැහැදිලි කිරීමයි

අප පුවත්පතේ මුල් පිටුවේ පෙරේදා (9) 'චීන - ශ්‍රී ලංකා පාලන අත්දැකීම් බෙදා ගන්න ජනපති - චීන ජනපති පිළිසඳරක්' යන මැයෙන් පළවූ ප්‍රවෘත්තිය පිළිබඳ ව පැහැදිලි කිරීමක් කළ යුතුව තිබේ. එම පුවතට පදනම් වූයේ සුම් තාක්ෂණයෙන් පසුගිය සතියේ (4) පැවැති ද්විපාර්ශ්වික හමුවකි.

පිට 06

බස් ධාවකයන්ට සහන රැසක් රජය තීරණය කරයි

මහින්ද අලුත්ගෙදර

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ අන්තර් පළාත් මගී බස්රථ ධාවන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බස් ධාවකයන්ට සහන රැසක් දීමට රජය තීරණය කරයි.

පිට 06

දීපාවලී උත්සවය නිවෙස්වල සිට